# 多言語情報コーナー　　　　　　　　　（令和７年　４月号）

## 1. තොචිගි නගරයෙහි පැවැත්වෙන සකුරා මල් උත්සව සහ ප්‍රසිද්ධ සකුරා මල් නැරඹිය හැකි ස්ථාන පිළිබඳ තොරතුරු

මේ අවුරුද්දේ ද නැවතත් සකුරා මල් සමය උදා වී ඇත. නගරය පුරා පැවැත්වෙන සකුරා මල් උත්සව සහ ප්‍රසිද්ධ සකුරා මල් පිපෙන ස්ථාන පිළිබඳව අපි ඔබට හඳුන්වා දෙන්නෙමු.

තයිහෙයි කන්දේ  සකුරා මල් උත්සවය මාර්තු මස 21 සිට අප්‍රේල් මස 13 දක්වා පැවැත්වේ. තයිහෙයි කන්දේ ඇති සකුරා මල් "ජපානයේ හොඳම සකුරා මල් පිපෙන ස්ථාන 100" න් එකක් ලෙස තෝරාගෙන ඇත. තායිහෙයි කන්ද පාමුල සිට ඉදිරියට යන දර්ශනීය මාර්ගයේ, ඔබට "සකුරා මල් මගින් නිර්මාණය කර ඇති උමග" ලෙස හඳුන්වන සකුරා මල් ගස් පේළියක් දැකිය හැකිය. කඳුකරයේ සකුරා ගස් 4,000ක් පමණ ඇති අතර එම සියලුම ගස් සකුරා මල් වලින් පිරී පවතී.

මාර්තු මස 28 සිට අප්‍රේල් 6 දක්වා පැවැත්වෙන ඔහිරා සකුරා මල් උත්සවය පැවැත්වෙන අතර , ඔහිරා ක්‍රීඩා උද්‍යානය ඉදිරිපිට සකුරා වීදිය දිගේ සකුරා මල් වලින් පිරිඇති ගස් සවස 6 සිට රාත්‍රී 9 දක්වා විදුලි පහන් වලින් ආලෝකමත් කෙරේ.

ෆුජියෝකා සකුරා උත්සවය මාර්තු මස 28 සිට මාර්තු මස 30 දක්වා ෆුජියෝකා වටරාසේ ක්‍රීඩා උද්‍යානයේදී පැවැත්වෙන අතර, බට පහන් සහිත සකුර මල් ගස් ආලෝකමත් කිරීම මෙහි විශේෂත්වයකි. 30 වන දින විවිධ උත්සව සහ ප්‍රදර්ශන කුටි පැවැත්වීමට සංවිධානය කර ඇත.

සුගානොසාතෝ හිදී පැවැත්වෙන මල් උත්සවය අප්‍රේල් මස  5 සිට අප්‍රේල් මස 13 දක්වා සුගානොසාතෝ  හිදී පැවැත්වේ. වසර 180ක් පැරණි සුගනොසාතෝ  සකුරා ඇතුළු විවිධ මල් පිපෙන කාල පරිච්ඡේද වෙනස් වන බැවින් ඔබට ඒවා දිගු කාලයක් විවිධ මල් දකබලගැනීමේ අවස්ථාව ලබාදෙනු ලැබේ. මෙම කාලය තුළ සෙනසුරාදා සහ ඉරිදා දිනවල විවිධ උත්සව පැවැත්වීමට සැලසුම් කර ඇත.

නිශිකාතා කනසකි සකුරා මල් උත්සවය මාර්තු මස 30 සිට අප්‍රේල් 6 දක්වා පැවැත්වෙන අතර එහිදී සකුරා මල් විවිධ විදුලි බුබුළුවලින් ආලෝකමත් කිරීම සිදුකරන ඇත අවසන් දිනවල විවිධ උත්සව සහ ප්‍රදර්ශන කුටි පැවැත්වීමට සංවිධානය කර ඇත.
ඔමෝයි ගං ඉවුර දිගේ විවිධ වර්ගයේ සකුරා මල් ගස් 200 ක් පමණ පේළියට ඇති අතර මෙම වසර එම ගස් සිටුවා වසර 100 ක් සනිටුහන් කරයි.

මියා නගරයෙ හි නගානෝ ගඟ හරහා මියානො පාලම අසල පිහිටා ඇති මියානෝ සකුරා, මල් ගස් 500 ක පමණ පේළියක් වන අතර එය ගඟ දිගේ කිලෝමීටර් 1.5 ක් පමණ විහිදේ. ඉබුකි-නෝ-සතෝ සකුරා මල් උත්සවය මාර්තු මස 29 සහ 30 යන දිනවල පැවැත්වේ.

# 多言語情報コーナー　（令和７年　４月号）

මාර්තු මස 30 වන දින, ඉවාණුනේ සකුරා උත්සවය ඉවාණුනේ මලල ක්‍රීඩා උද්‍යානයේදී පැවැත්වේ. පොදු උද්‍යානයේ ඇති මෙම සකුරා මල් ගස් සිටුවා වසර 20 පමණ වන අතර ඒවා දැන් විශාල පරිණත ගස් බවට පත්වී ඇත.තවද මෙහිදී විවිධ උත්සව සහ ආහාර අලෙවිසැල් පැවැත්වීමට නියමිතය.

නගරය තුල ඇති මෙවැනි දෑ දැකබලා ගැනීමට මෙම අවස්ථාව ප්‍රයෝජනයට ලබාගැනීමට ඔබට හැකියාව ඇත.

## 2. නව ත්සුගා ප්‍රධාන ශාඛා කාර්යාලය විවෘත කිරීම පිලිබදව

නව ත්සුගා ප්‍රධාන ශාඛා කාර්යාලය පෙබරවාරි 25 වන දින විවෘත කරන ලදී.
එය පිහිටා ඇත්තේ සුගා නගරයේ හරජුකු හි වන අතර, එය මීට ඉහතදී සංස්කෘතික මධ්‍යස්ථානය පිහිටා තිබූ ස්ථානයයි.

කෙසේ වෙතත්, මෙය ප්‍රධාන ශාඛා කාර්යාලයක් පමණක් නොව ප්‍රජා මධ්‍යස්ථානයක් සහ පුස්තකාලයක කාර්යයන් ඒකාබද්ධ කරන ලද සංකීර්ණයක් ලෙස සහ පොදු පහසුකම් ප්‍රතිසංවිධානය සඳහා ආදර්ශයක් ලෙස සංවර්ධනය කරන ලදී.

මෙහි පළමු මහලේ ප්‍රධාන ශාඛා කාර්යාලය සහ පුස්තකාලය පිහිටා ඇත. පුස්තකාලයේ පොත් විසි දහසකට (20,000 ) අධික එකතුවක් මෙන්ම අධ්‍යාපන සඳහා වෙන්වූ කොටසක් සහ ළමුන් සඳහා වෙන්වූ කොටසක්ද ඇති අතර එය ප්‍රදේශවාසීන්ට විවිධ අධ්‍යාපන සහ ක්‍රියාකාරකම් වෙනුවෙන් භාවිතා කළ හැකිය.

දෙවන මහල ප්‍රජා මධ්‍යස්ථාන ලෙස භාවිතා කරන අතර විශාල, මධ්‍යම හා කුඩා සම්මන්ත්‍රණ ශාලා , මුළුතැන්ගෙයක්ද , නර්තන පුහුණුව ආදිය සඳහා භාවිතා කළ හැකි බහුකාර්ය කාමරයක් ද ඇත. බහුකාර්ය කාමරයට පුද්ගලයින් 300 දෙනෙකු දක්වා නවාතැන් ගත හැකිය. මෙතැන් සිට, එය පැරණි ත්සුගා ප්‍රජා මධ්‍යස්ථානය වෙනුවට භාවිතා කරනු ඇති අතර ආපදා තත්වයකදී හදිසි ඉවත් කිරීමේ නවාතැනක් ලෙසද භාවිතා කරනු ඇත.

ත්සුගා ප්‍රජා මධ්‍යස්ථානය තුළ භාවිතා නොකරන නිල ඇඳුම් එකතු කර ඒවා තවත් අවශ්‍ය ඊළඟ පුද්ගලයන්ට ලබා දෙන නිල ඇඳුම් බැංකුවක් ද ඇත, එබැවින් කරුණාකර එය භාවිතා කිරීමට හැකියාව ඇත.

## 3. කවුන්ටරය විවෘත කර ඇති වේලාවන් දිගු කිරීම පිළිබඳව

තොචිගි නගරය එහි පදිංචිකරුවන්ගේ පහසුව වැඩි දියුණු කිරීම සඳහා එහි නිතර භාවිතා වන කවුන්ටරවල විවෘත වේලාවන් දීර්ඝ කරනු ලැබේ.

නගර ශාලාවේ ප්‍රධාන ගොඩනැගිල්ලේ සෑම බදාදා දිනකම සිවිල් ජීවිත අංශය, රක්ෂණ සහ විශ්‍රාම වැටුප් අංශය සහ බදු අංශය විවෘතව පවතී.

ඕහිරා, ෆුජියෝකා, ත්සුගා, නිෂිකාතා සහ ඉවාෆුනෙ යන ප්‍රධාන ශාඛා කාර්යාලවල, ප්‍රජා සංවර්ධන ප්‍රවර්ධන අංශය සෑම මසකම දෙවන බදාදා දින විවෘතව පවතී.

නගර ශාලාවේ ප්‍රධාන ගොඩනැගිල්ලේ සහ සෑම ශාඛා කාර්යාලයකම සවස 5:15 සිට 7:00 දක්වා ලෙස කවුන්ටරය විවෘත කර ඇති වේලාවන් දික් කරනු ලැබේ.

අලුත් අවුරුදු නිවාඩු සහ රජයේ නිවාඩු දින හැර එය අවුරුද්ද පුරා විවෘතව පවතී.

විශේෂයෙන්, ඕහිරා ප්‍රධාන ශාඛා කාර්යාලයේ, සෑම බදාදා දිනකම සවස 3:00 සිට 5:15 දක්වා කවුන්ටරයේ ඉංග්‍රීසි පරිවර්තකයින් ලබා ගත හැකිය. සෑම මසකම දෙවන බදාදා දිනවල, අපගේ සේවාවන් සවස 7 දක්වා ලබා ගත හැකිය. කරුණාකර ඉහත සේවාවන් භාවිතා කිරීමට වගබලා ගන්න.

## 4. ජාතික විශ්‍රාම වැටුප් රක්ෂණ වාරික පිළිබඳ දැනුම්දීම

ජාතික විශ්‍රාම වැටුප් රක්ෂණ වාරික මුදල සෑම වසරකම වෙනස් වනු ලැබේ. 2025 (රෙයිවා 7)මූල්‍ය වර්ෂය සඳහා මාසික ගාස්තුව යෙන් 17 510 ක් වේ .

මුදල් මගින් ගෙවන අයට අප්‍රේල් මස මුලදී ජපන් විශ්‍රාම වැටුප් සේවා අංශය මගින් ගෙවීම් පත්‍රිකා තැපැල් මගින් ලැබෙනු ඇත. කරුණාකර ඔබේ මාසික විශ්‍රාම වැටුප් රක්ෂණ වාරිකය ඊළඟ මාසයේ අවසාන දිනට පෙර ගෙවීම් සිදුකල යුතුය.

පොදු විශ්‍රාම වැටුප් ක්‍රමය යනු මාසික රක්ෂණ වාරික ගෙවීමෙන්, ඔබ වයසට ගිය විට හෝ ආබාධිතභාවය හෝ මරණය වැනි අනපේක්ෂිත සිදුවීම් සිදු වූ විට මුදල් ලබා ගත හැකි පද්ධතියකි.
ජපානයේ වෙසෙන වයස අවුරුදු 20 ත් 59 ත් අතර සියලුම පුද්ගලයින්, ඔවුන්ගේ ජාතිකත්වය නොසලකා, ජපානයේ පොදු විශ්‍රාම වැටුප් ක්‍රමයට ඇතුළත් වීම අනිවාර්ය වන අතර සේවක විශ්‍රාම වැටුප් රක්ෂණයට ලියාපදිංචි වී නොමැති පුද්ගලයින් ජාතික විශ්‍රාම වැටුප් රක්ෂණයට ලියාපදිංචි වීම අනිවාර්ය වේ.

ඔබේ ආදායම ඉතා අඩු නම් රක්ෂණ වාරික ගෙවීමට අපහසු නම්, වාරික ගෙවීමෙන් නිදහස් වීම සඳහා ඔබට අයදුම් කළ හැකිය.

ඊට අමතරව, ඔබ ශිෂ්‍යයෙක් නම් සහ අඩු ආදායමක් ඇති නම් සහ රක්ෂණ වාරික ගෙවීමට අපහසු නම්, ඔබට "ශිෂ්‍යයන් සඳහා වන ගෙවීම් නිදහස් කිරීම" යන පහසුකම සඳහා ඉල්ලුම් කළ හැකිය.

ඔබ ජපානයේ ස්ථිර පදිංචිය සඳහා අයදුම් කිරීමේදී, ඔබගේ ජාතික විශ්‍රාම වැටුප් දායකත්ව තත්ත්වය දැඩි ලෙස පරීක්ෂා කරනු ලැබේ, එබැවින් ජපානයේ ස්ථිරව පදිංචි වීමට බලාපොරොත්තු වන ඕනෑම අයෙකු ජාතික විශ්‍රාම වැටුප් රක්ෂණ වාරික ගෙවිය යුතුය.